ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
පාර්ලිමේන්තුව

---

# 1988 අංක 37 දරන පළාත් සභා (වැටුප් හා දීමනා ගෙවීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 1988 නොවැම්බර් මස 09 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1988 නොවැම්බර් මස 11 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිළ : ශත 45 යි. නැපැල් ගාස්තුව : ශත 75 යි.

## 1988 අංක 37 දරන පළාත් සභා (වැටුප් හා දීමනා ගෙවීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1988 නොවැම්බර් මස 09 වන දින]

එල්. ඩී.—ඕ. 29/88

**පළාතක ආණ්ඩුකාරවරයකුට ද ප්‍රධාන අමාත්‍යවරයාට ද පළාතක පළාත් අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයකුට ද පළාත් සභාවේ මන්ත්‍රීවරයකුට ද ගෙවිය යුතු වැටුප් හා දීමනා සම්බන්ධයෙන් සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 1988 අංක 37 දරන පළාත් සභා (වැටුප් හා දීමනා ගෙවීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. **ලුහුඬු නාමය**

**2.** අවස්ථාවෝචිත පරිදි ස්වකීය පත්වීමේ හෝ තෝරා පත් කරනු ලැබූ දින සිට සහ ඉන් පසුව,—

පළාත් සභා ආණ්ඩුකාරවරයන්ට, ප්‍රධාන අමාත්‍යවරයන්ට, අමාත්‍ය මණ්ඩල සාමාජිකයන්ට සහ මන්ත්‍රීවරයන්ට ගෙවිය යුතු වැටුප් සහ දීමනා.

(අ) පළාතක ආණ්ඩුකාරවරයාට, අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයකුට දැනට ගෙවනු ලබන මාසික වැටුප සහ අනෙකුත් සියලු දීමනා හා සමාන මාසික වැටුප් සහ දීමනා ගෙවනු ලැබීමට හිමිකම තිබිය යුතු ය ;

(ආ) පළාතක ප්‍රධාන අමාත්‍යවරයාට (අ) ඡේදය යටතේ පළාතක ආණ්ඩුකාරවරයාට ගෙවනු ලබන මාසික වැටුප සහ අනෙකුත් සියලු දීමනාවලට සමාන මාසික වැටුප් සහ දීමනා, රුපියල් පනහක මුදල් ප්‍රමාණයක් අඩුකර ගෙවනු ලැබීමට හිමිකම තිබිය යුතු ය ;

(ඇ) පළාතක අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයකුට, නියෝජ්‍ය අමාත්‍යවරයකුට දැනට ගෙවනු ලබන මාසික වැටුප සහ අනෙකුත් සියලු දීමනා හා සමාන මාසික වැටුප් සහ දීමනා ගෙවනු ලැබීමට හිමිකම තිබිය යුතු ය ;

(ඈ) පළාත් සභාවේ මන්ත්‍රීවරයකුට, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුට, දැනට ගෙවනු ලබන මාසික වැටුප සහ අනෙකුත් සියලු දීමනාවලින් සියයට පනහකට සමාන මාසික වැටුප් සහ දීමනා ගෙවනු ලැබීමට හිමිකම තිබිය යුතු ය.

**3.** පළාතක ප්‍රධාන අමාත්‍යවරයාට, පළාත් අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයකුට සහ පළාතක් සඳහා පිහිටුවා ඇති පළාත් සභාවක මන්ත්‍රීවරයකුට මේ පනත යටතේ ගෙවිය යුතු වැටුප් සහ දීමනා, ඒ පළාතේ පළාත් සභා අරමුදලට වැය බරක් වන වියදමක් වන්නේ ය.

වැටුප් සහ දීමනා පළාතක පළාත් සභා අරමුදලට වැය බරක් වන වියදමක් විය යුතු බව.

2—ජ 104450—8,160 (88/08)

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 177 යි. (විදේශීය) රු. 236 යි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.